# සිංහල භාෂාව හා සාහිත්‍යය

## 7 ශ්‍රේණිය



## 20. පාඩම

## සකස් කඩ නොකී කට

## 2.0 නිපුණතාව

ජීවන අත්දැකීම් පුළුල් කර ගැනීම සඳහා කියවීමේ පුරුදු අර්ථවත් ව යොදා ගනියි.

## 2.1 නිපුණතා මට්ටම

නිවැරදි උච්චාරණයෙන් හා හඬ පාලනයෙන් යුතු ව ශබ්ද නගා කියවයි.

## ක්‍රියාකාරකම 01

- පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

1. අකුරු කරන්නට ම ලියැවුණු පැරණි පොත් දහ අටක් මේ පාඩමේ සඳහන් වේ. ඒවා අතරින් පහක් ලියා දක්වන්න.

.........................................................................................................

2. අකුරු උච්චාරණය කරවීමේ අටියෙන් ම ලියැවුණු පැරණි ග්‍රන්ථය කුමක් ද?

.........................................................................................................

3. 'සකස් කඩ නොකී කට ........................................' යන ප්‍රකාශය සම්පූර්ණ කරන්න.

4. 'ගණදෙවි හෑල්ල' යන්නෙහි ඉරි ඇඳි අකුරුවල පිල්ලම් නම් කරන්න.

.........................................................................................................

5. 'හ් + ඉ + ත් + ඕ + ප් + අ + ද් + ඒ + ශ් + අ + ය් + අ' මෙහි ස්වර ව්‍යඤ්ජන ගැළපූ විට ලැබෙන ග්‍රන්ථ නාමය ලියන්න.

.........................................................................................................

## ක්‍රියාකාරකම 02

- පහත සඳහන් ප්‍රකාශ නිවැරදි නම් (✓) ලකුණ ද වැරදි නම් (✗) ලකුණ ද යොදන්න.

1. ශබ්ද නගා කියවීමෙන් උච්චාරණ දෝෂ මගහරවා ගත හැකි ය. (      )
2. ශබ්ද උච්චාරණයේ ස්වභාවය මත කියවන දෙය ශ්‍රාවකයාට අවධාරණය වේ. (      )
3. පුවත්පතක් කියවන ආකාරයට ම ශ්ලෝකයක් කියවිය හැකි ය.(      )
4. පුවත්පත් වාර්තා ලියන්නේ ඉතා සරල භාෂාවෙනි. (      )

5. සංස්කෘත පද බහුල සිංහල ව්‍යවහාරය පුවත්පත් භාෂාවට වඩා වෙනස් ය. (     )

6. කුමාරතුංග මුනිදාස මහතා 'ශික්ෂා මාර්ගය' නම් ග්‍රන්ථයක් රචනා කොට තිබේ. (     )

7. 'විද්‍යා දදාති විනයං' යන ශ්ලෝකය ඇතුළත් වනුයේ 'හිතෝපදේශය' නම් කෘතියේ ය. (     )

8. අකුරු කරන්නට ම ලියැවුණු කෘති දහයක් සිංහල සාහිත්‍යයේ දක්නට ලැබේ. (     )

# ක්‍රියාකාරකම 03

- පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු ලියන්න.

1. භාෂණයේ දී (කතා කිරීමේ දී) විරාමය හඟවන්නේ කෙසේද?
2. ලේඛනයේ දී විරාමය හැඟවීමට භාවිත සංකේත සඳහා ව්‍යවහාර වන නම ලියන්න.
3. දෙතිත යෙදෙන අවස්ථා දෙකක් සඳහන් කරන්න.
4. උපුටා ගත් ප්‍රකාශයක හෝ පාඨයක හෝ කතුවරයා දැක්වීමේ දී භාවිත වන විරාම ලක්ෂණය කුමක් ද?
5. පෙති කරල් එක දෙක බැගින් කෑමට පෙර පසු ගන්න

   ඉහත වාක්‍යය විරාම ලක්ෂණ යොදා නැවත ලියන්න.

## ක්‍රියාකාරකම 04

- පහත සඳහන් වාක්‍ය විරාම ලක්ෂණ යොදා නැවත ලියන්න.

1. සියලු සත්ත්වයෝ නිදුක් වෙත්වා
2. නරියා ගමින් ඇවිදිල්ලා

   ගමින් ඇවිදිල්ලා
3. ලං වි ම
4. සිංහල පෙළ පොතේ 28 36 පිටු බලන්න
5. යකඩ මෙවලම් භාවිතයට පෙර මෙරට භාවිතයේ පැවතියේ කුමන මෙවලම් ද

# ක්‍රියාකාරකම 05

- **පහත සඳහන් යෙදුම්වලට සමාන අර්ථ වරහන් තුළින් තෝරන්න.**

1. ජන ශූන්‍ය - ..........................
2. සහස්‍ර - ..........................
3. වාරි - ..........................
4. සමාගමය - ..........................
5. සංරක්ෂණය- ..........................
6. රාශි භූත - ..........................
7. ඉසියුම් - ..........................
8. දේශජ - ..........................
9. වාපියෙන් - ..........................
10. පද්ධතියක්- ..........................

(සමූහයක්, දහස, වැවෙන්, ජනයා පදිංචි නැති, ඉතා සියුම් වූ, ජලය, එක්රැස් වූ, ආශ්‍රය, දේශයේම බිහි වූ, රැක ගැන්ම )

# ක්‍රියාකාරකම 01 - පිළිතුරු

1. හෝඩිය, නම් පොත, මඟුල් ලකුණ, ගණ දෙවි හැල්ල, වදන් කවි පොත, බුද්ධ ගජ්ජය, සකස් කඩ, නාමාෂ්ට ශතකය, නවරත්නය, ව්‍යාසකාරය, හිතෝපදේශය, ප්‍රත්‍ය ශතකය, අනුරුද්ධ ශතකය, බෞද්ධ ශතකය, සූර්ය ශතකය, වෘත්ත මාලාව, වෘත්ත මාලාඛ්‍යාව, අමරසිංහය

2. සකස් කඩ

3. 'සකස් කඩ නොකී කට - උගේ කට හුඹස් කට'

4. කොම්බුව, ඉස්පිල්ල, දීර්ඝ ඇදය, හල් ලකුණ

5. හිතෝපදේශය

## ක්‍රියාකාරකම 02 - පිළිතුරු

1. ශබ්ද නගා කියවීමෙන් උච්චාරණ දෝෂ මගහරවා ගත හැකි ය. ( ✓ )
2. ශබ්ද උච්චාරණයේ ස්වභාවය මත කියවන දෙය ශ්‍රාවකයාට අවධාරණය වේ. ( ✓ )
3. පුවත්පතක් කියවන ආකාරයට ම ශ්ලෝකයක් කියවිය හැකි ය.( ✗ )
4. පුවත්පත් වාර්තා ලියන්නේ ඉතා සරල භාෂාවෙනි. ( ✓ )

5. සංස්කෘත පද බහුල සිංහල ව්‍යවහාරය පුවත්පත් භාෂාවට වඩා වෙනස් ය. ( ✓ )

6. කුමාරතුංග මුනිදාස මහතා 'ශික්ෂා මාර්ගය' නම් ග්‍රන්ථයක් රචනා කොට තිබේ. ( ✓ )

7. 'විද්‍යා දදාති විනයං' යන ශ්ලෝකය ඇතුළත් වනුයේ 'හිතෝපදේශය' නම් කෘතියේ ය. ( ✓ )

8. අකුරු කරන්නට ම ලියැවුණු කෘති දහයක් සිංහල සාහිත්‍යයේ දක්නට ලැබේ. ( ✗ )

# ක්‍රියාකාරකම 03 - පිළිතුරු

1. අංග චලනය, හඬ උස් පහත් කිරීම , මුහුණේ ඉරියව් ආදිය මගින්

2. විරාම ලක්ෂණ

3. * ගණිත ප්‍රකාශකයක අනුපාතයක් ලියා දැක්වීමේ දී

   * සංවාදයක් ලියා දැක්වීමේ දී

4. කෙටි ඉර

5. පෙති/කරල් එක/දෙක බැගින් කෑමට පෙර/පසු ගන්න.

# ක්‍රියාකාරකම 04 - පිළිතුරු

1. සියලු සත්ත්වයෝ නිදුක් වෙත්වා !
2. නරියා : ගමින් ඇවිදිල්ලා
   ගමින් ඇවිදිල්ලා
3. ලං.වි.ම.
4. සිංහල පෙළ පොතේ 28 - 36 පිටු බලන්න
5. යකඩ මෙවලම් භාවිතයට පෙර මෙරට භාවිතයේ පැවතියේ කුමන මෙවලම් ද?

# ක්‍රියාකාරකම 05 - පිළිතුරු

1. ජන ශූන්‍ය - ජනයා පදිංචි නැති
2. සහස්‍ර - දහස
3. වාරි - ජලය
4. සමාගමය - ආශ්‍රය
5. සංරක්ෂණය- රැක ගැන්ම
6. රාශි භූත - එක්රැස් වූ
7. ඉසියුම් - ඉතා සියුම් වූ
8. දේශජ - දේශයේම බිහි වූ
9. වාපියෙන් - වැවෙන්
10. පද්ධතියක්- සමූහයක්

සැකසුම - මහේන්ද්‍ර මද්දේගම
චන්ද්‍රරතන විද්‍යාලය, කැලණිය